# අපේ කාලේ කතන්දර



රසික සූරියආරච්චි

පසුගිය වසරේ කෙටි නිවාඩුවකට ලංකාවට ගොස් සිටි කාලයේ දී මා ලද මේ අත්දැකී-මෙන්, මුලින් ම මා මවිත වුණා ද, පසුව ඇති වූයේ අනුකම්පාව මුසු කේන්තියකි. මෙය කියවනා ඔබට ඇතිවන හැඟීම් සමුදාය කොයි ආකාරයේ වුවත්, එය යම් ආකාරයක අපූර්වත්වයක් ද මවනු ඇතැයි සිතමි.

## කරුණාවතී ගේ දාන පාරමිතාව

අපේ අම්මා ද සාමාජිකාවක් වන ගමේ වැඩිහිටි සමිතිය නිසා, වයස හැත්තෑවේ අසූවේ මහලු වයසේ පසුවෙන, තම සැමියන් මිය ගොස් වැන්දඹුවන් ලෙස කල් ගත කරන, කිසිදු ආදායම් මාර්ගයක් නොමැති, විවාහ වූ



තම දරුවකු ගේ නිවසේ වෙසෙන, ජීවිතයේ මේ සැඳෑ සමයේත් අනවශ්‍ය ප්‍රශ්නවලට මැදිහත් වී දුක් විඳිමින් සිටින, කාන්තාවන් කීප දෙනෙකු ම මට දැන හඳුනා ගන්නට ලැබුනි.

මගේ මව ඇගේ මේ යෙහෙළියන්ගෙන් යම් ආකාරයකට වෙනස් වන්නේ, ඇයට මාසිකව වැන්දඹු වැටුපක් ලැබෙන නිසාත්, ඇය ජීවත්වන්නේ නිවසේ තනිව ම නිසාත් ය. මව ගේ මිතුරියන් අතරින් ඇයට වඩා වසර කිහිපයකින් වයසෙන් අඩු ඉන් එක් කාන්තාවක් වන කරුණාවතී විටින් විට මගේ මව ගේ නිවසට පැමිණ විවිධ උදව් උපකාර කිරීමට පුරුදු වී සිටියි. ඇය කලක් මගේ මවගේ තනියට නිවසේ නවාතැන් ගෙන ද සිටියා ය. මගේ මව ද, කරුණාවතීට හැකි අයුරින් මුදලින් ද, අන් අයුරින් ද, උදව් උපකාර කරන්නී ය. එය අප වින්-වින් ලෙස ඉංග්ලිෂ් භාෂාවෙන් හඳුන්වන අදාළ දෙපාර්ශවයට ම වාසිදායක තත්වයකි. මෙවර ලංකාවේ මා ගත කළ කාලයේ දෙතුන් දිනක් ම මට මගේ මවගේ නිවසේ දී කරුණාවතී මුණ ගැසුණි. අවසන් දිනයේ දී ද ඇය අප නිවසට උදේ පාන්දරින් ම ආවේ වෙනත් ගමනක් යාමට සැරසී ය.

"පුතේ මේ නැන්දාට දැන් පැන්ෂන් එකක් ලැබෙනවා නේ. මේ ඒක ගන්න යන ගමන් ලු!" අම්මා පැවසුවා ය.

මා එතෙක් දැන සිටියේ වැන්දඹුවක වූ කරුණාවතීට කිසිදු ආදායමක් නොමැති බවත්, හදිසි අනතුරකින් තම පුතා මිය ගිය පසුව ඇය මුණුපුරා රැකබලා ගනිමින් ලේලිය සමග ජීවත්වෙන බවයි.

"ආ, ඉතිං හොඳයිනේ නැන්දාට පෙන්ෂන් එකක් ලැබෙනවා නම්! ළඟදී ඉඳලාද ඒ?" මම කරුණාවතී ගෙන් විමසුවෙමි.

"ඔව් මෙයා කොහොම හරි ග්‍රාම සේවකට කියලා හදාගෙන. රුපියල් දෙදාස් පන්සීයක් ම ලැබෙනවා!" අම්මා කීවේ මඳ සිනාවක් ද සමග ය.

ඒ මිතුරු සරදමක් බවත්, කරුණාවතීට රජයේ දීමනාවක් ලෙස ලැබෙන්නේ මසකට ම රුපියල් දෙසිය පනහක් පමණක් බවත් මම මොහොතකින් දැන ගත්තෙමි.

මා කළේ, "මෙන්න එහෙනම් මගෙනුත් නැන්දාට!" කියා රුපියක් දෙදහස් පන්සීයක් කරුණාවතී අතට දීමයි.

පැයක් පමණ කාලයක් අප නිවසේ ගත කළ කරුණාවතී පිටව යාමට කලින් මා අමතා " පුතා මං පන්සලේ කුළුණක් හදන්න රුපියල් අටදාහක් දෙන්න ලියලා තියෙනවා. පුතා දුන්නු සල්ලිවලින් ඒකට ගන්නම්, පුතාටත් පින් සිද්ධ වෙයි" කියා කීවා ය.

මම තරමක් විස්මයට පත්වීමි.

"අපෝ මට ඔය ලැබිලා තියෙන පින් ඇති. ඔය සල්ලි කරුණාවතී නැන්දා කෑමට බීමට ගන්න!" මම ස්ථිර හඬින් කීවෙමි.

කවුරුන් හෝ විටින් විට දෙන මුදලක් සහ මසකට ලැබෙන රුපියල් දෙසිය පනහක ආ-ණ්ඩුවේ පින් පඩිය හැර වෙනත් කිසිදු ආදා-යමක් නැති, ඥාතියෙකු ගේ නිවසේ තාවකාලිකව නතර වී සිටින කරුණාවතී වැන්නියක, ඇගේ තත්වයේ හැටියට අති විශාල මුදලක් වන රුපියල් අටදාහක් ම පන්සලේ කුළුණක් සෑදීම වැනි නොවැදගත් වැඩක් සඳහා පරිත්‍යාග කිරීමට පොරොන්දු වී ඇත්තේ, එයින් තමන්ට පින් ලැබේ ය, ඒ පින් බලෙන් මතු ආත්මයේ හෝ තමන්ට අදට වඩා හොඳ ජීවන තත්වයක් ලැබේ ය, යන චේතනාවෙන් බව පැහැදිලි ය.

ඒ ගැන මගේ අවුලක් නැත.

මා දුන් මුදල දැන් ඇගේ ය. එය ඇය කැමැති ආකාරයකට වියදම් කළ හැක. ඒ ගැන ද මගේ අවුලක් නැත.

නමුත්, මෙවැනි අය ගේ වත්මන් අසරණකම සහ එ නිසාම ඇතිවෙන අනාගතය උදෙසා පින් කිරීමේ අවශ්‍යතාව දඩමීමා කරගෙන කුළුණු, තාප්ප වැනි අනවශ්‍ය ඉදිකිරීම් සැලසුම් කරන පන්සල් සහ ඒවායේ ලොක්කන් ගැන නම් මට ඇති වෙන්නේ කෝපයකි.
මගේ අතිරික්ත මුදල් එවැනි නිෂ්ඵල වැඩවලට දීමට වඩා නැති බැරි අයෙකුට දීමට මා කැමති බව අමුතුවෙන් කිව යුතු නොවේ.

මේ සිදුවීම සම්බන්ධයෙන් මට ඇතිවුණු කොටස් කිහිපයකින් යුතු අතුරු ප්‍රශ්නයක් නම්, මා දුන් මුදල කරුණාවතී පන්සලේ කුළුණ සෑදීම සඳහා පරිත්‍යාග කළහොත්, එයින් පිං ලැබෙන්නේ කාටද? ඇයට ද, මට ද? අප දෙදෙනාට ම එයින් පින් ලැබේ නම් එය බෙදී යන්නේ කොයි කොයි ප්‍රතිශතයන් ගෙන් ද?, කරුණාවතීට මුදල් දුන් නිසා මට පින් වෙනම ද, ඇය පන්සලේ කුළුණ සඳහා මුදල් දුන් නිසා ඇයට පින් වෙනම ද වශයෙන් එක මුදලින් දෙගුණයක් පින් ලැබේ ද? යන්න ය.

Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718
info@warnalegal.com
warnalegal1